**ශීර්ෂය - 025 - සීමා නීර්ණය කොමිෂන් සභාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 025 - සීමා නීර්ණය කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 21 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සීමා නීර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සීමා නීර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 03 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන්කර තිබුණු එකතුව රු.150,000 ක්වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | අදාල පරිපුරක ඇස්තමේන්තු ප්‍රතිපාදන පළාත් පාලන ආයතන කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ ජාතික කමිටුව වෙනුවෙන් ලද ප්‍රතිපාදන වේ. | නිසි සැලසුමකින් යුතුව පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතු වේ. |
| (ආ) | වැය විෂයයන් 02 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.950,000 ක් වෙන් කරගෙන තිබුණු අතර එම වැය විෂයන්ගේ ඉතිරිය රු.279,127 ක් හෙවත් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 29 ක් විය. | අදාල පරිපුරක ඇස්තමේන්තු ප්‍රතිපාදන පළාත් පාලන ආයතන කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ ජාතික කමිටුව වෙනුවෙන් ලද ප්‍රතිපාදන වේ. | නිසි සැලසුමකින් යුතුව පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතු වේ. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී . | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 262(2) | ගෙවනු ලැබූ සියළුම වවුචර්වල හා ගෙවීම් තහවුරු කෙරෙන ලේඛණවල "ගෙවන ලදී" මුද්‍රාව සටහන් කර නොතිබුණි. | මෙවැනි අඩුපාඩු ඉදිරියේදි ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම මෙම වසරේදී සකස් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ එක් කාර්යයක් ලෙස කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා පුහුණුව ලබා දීමට සැලසුම් කර තිබුණද එම පුහුණු වැඩසටහන් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණු අතර පුහුණු වැඩසටහන් ගණනද සැලසුමෙහි දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂ වලදී පුහුණු වැඩසටහන් ප්‍රමාණය කොපමණද යන්න ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් කාර්යයන් සම්බන්ධ දත්ත සියල්ල ඇතුළත් කළ යුතු වේ. |

### 3.2 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් කොමිෂන් සභාවේ කාර්යභාරය හා බලතල සම්බන්ධයෙන් පැහැදිළි කර නොතිබුණද කොමිෂන් සභාව වෙත විසර්ජන පනතින් 2021 හා 2022 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 14.22 ක් හා රු. මිලියන 15.98 ක් වෙන් කරදී තිබුණු අතර එම ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු.මිලියන 11.13 ක් හා රු. මිලියන 14.10 ක් වැය කර තිබුණි. | අදාල වියදම් 2021 හා 2022 වර්ෂවල වැටුප් හා අත්‍යවශ්‍ය පුනරාවර්තන වියදම් වෙනුවෙන් දරන ලද වියදම් වන අතර නිශ්චිත කාරයභාරයක් මේ වන තෙක් පවරා නොමැති වුවද, ඉදිරියේදී අදාල සීමා නීර්ණය කටයුතුවල කාර්යයන්ට අවශ්‍ය තොරතුරු හා දත්ත රැස්කිරීමේ කාර්යයන්හි කොමිෂන් සභාව නිරතව සිටින අතර 2022 වර්ෂයේ නොවැම්බර් සිට පත් කරන ලද පළාත් පාලන කොට්ඨාශ සීමා නීර්ණය කිරීමේ ජාතික කමිටුවේ කාර්යයන් ඉටු කරන ලදී. | කොමිෂන් සභාවට නිශ්චිත කාර්යභාරය හා බලතල පවරා නොතිබීම පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) කොමිෂන් සභාව සඳහා පනතක් සකස් කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් 2017 හා 2018 වර්ෂවලදී අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පතක් ඉදිරිපත් කර තිබුණද විගණිත දිනය දක්වාම පනත පිළියෙල කිරීමේ කටයුතු නිම කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන ඉදිරි පියවර ගත යුතු වේ. |
| (ඇ) ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන 02 ක් 2016 වර්ෂයේ සිට කොමිෂන් සභාවේ කටයුතු සඳහා යොදාගෙන තිබුණද විගණිත දිනය වන 2023 ජනවාරි 31දින දක්වාම මෙම වාහන කොමිෂන් සභාව වෙත පවරාගෙන නොතිබුණි . | අදහස් දක්වා නොතිබුණි. | කොමිෂන් සභාව විසින් පරිහරණය කරන දේපල පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2016 පෙබරවාරි 05 දින අංක DMS/1029 ලිපියෙන් කොමිෂන් සභාව වෙත තනතුරු 15 ක් අනුමත කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට ඉන් තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුනි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ ලේකම් තනතුර හා ගණකාධිකාරී තනතුර 2016 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති අතර ඒ සඳහා 2016 වර්ෂයේ සිට වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර තිබුණි. | කොමිෂන් සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ වෙනත් පනතක් මඟින් මෙතෙක් නිශ්චිත රාජකාරියක් පවරා නොමැති බැවින් අනුමත තනතුරු සියල්ල සම්පූර්ණ කිරීමට කටයුතු නොකළ අතර ඉදිරියේදී අවශ්‍යතාවය අනුව බඳවාගැනීම් සිදු කරමි. ලේකම් තනතුරේ හා ගණකාධිකාරී තනතුරේ රාජකාරි, වැඩ බැලීමේ පදනම මත ආවරණය කර ගෙන ඇත. | කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පවතී නම් ඒවා සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |